


**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යාපන සේවය සහ දිනමිණ පුවත්පත ඒකාබද්ධව කෙරෙන බුද්ධි ප්‍රබෝධය අධ්‍යාපනික සද්කාරය.**

# සිංහල

සැලකිය යුතුයි : පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

01. පහත දැක්වෙන උධෘත අතුරෙන් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේදී වර්තමාන ලේඛන ව්‍යවහාරයම යොදා ගන්න.)

(අ) සිටුදුවණියෝත් එවක් පටන් ඔහු සිත් ගන්ට සව්හරණලා සැරහීගෙන තුමූ ම ඕ හට බත් මාළු පිසති, කවති, පොවති, ඉස සෝධවති, නාවති, සොරාණෝද කීප දවසකින් කළ උපකාරත් නොසලකා මෑ මරාපියා මෑගේ ආභරණ හැරගෙන රා බී ඇවිදිනවුන්ට විකොටපියා අභිප්‍රාය දෙයක් හැරගෙන කාපියන්නේ කවර දවසෙක දෝහෝයි සිතීය. සිතාලා එක් උපදෙසක් සලකා බත් නොකා හැඳට නැඟිලා වැදහොත්තෝය. සිටුදුවණියෝ ගොසින් ලෙඩක් කියාදැ'යි විචාරා නැතැ ' යි කී කල්හි අපගේ දෙමව්යන්ගෙන් මුසුප්පුවක් ඇති කියා දැ'යි විචාරා එයිත් නැතැයි කී කල්හි එසේ කල මුසුප්පු හැයි' දැ' යි කියුය. ''සොඳුර'' එදවස් මරන්ට ගෙන යන ගමනේ. සොරුන් හෙළන ගල වසන දෙවියන්ට යාදිනියක් කොට දිවි ලදිමි.

I. සිටු දුවණියෝ සියලූ සත්කාර කළේ කාටද?
II. එකී පුද්ගලයා තුළ තිබූ විෂම අදහස කුමක්ද?
III. අපගේ දෙමව් පියන්ගෙන් මුසුප්පුවක් ඇති නියාදැයි මෙම පාඨය ලිහිල් බසින් ලියන්න.
IV. රා බී ඇවිදින්නවුන්ට විකොට පියා කෙටි විවරණයක යෙදෙන්න.

(ලකුණු 4)

(ආ) එකල විදර්ශනා වඩා ඒ වස්සානය ඇතුළත භද්දිය තෙරුන් වහන්සේ රහත්ව භද්දිය නම් මහතෙරව බුද්ධ ශාසන නමැති මහසරසියෙහි පුපිපි මහා පද්මයක් සේ ශීලසුගන්ධයෙන් තුන් ලෝ හෙබවූ සේක. ආනන්ද මහතෙරුන් වහන්සේද, එසේ ම සෝවාන් ව බුද්ධෝපස්ථායකයන් කෙරෙහි අග්‍රවුස්ථානාන්තර ලදින් බුද්ධශාසන නමැති ආකාශයෙහි නැගූ ජය කේතුවක් සේ ඉතා ප්‍රසිද්ධ වූ සේක. කිම්බිල භගුයයි දෙදෙනා වහන්සේ ද එසේ රහත්ව පන්සිය පන්සිය පිරිස් ගෙන බුද්ධ ශාසන නමැති දිව්‍යරූපයෙහි දිව්‍ය නේත්‍ර යුග්මයක් සේ ඉතා ශෝභා සම්පන්න වූ සේක. දේව දත්තයෝ ද තිස්ස නම් මහ තෙරව ධ්‍යානලාභි වූහ. ඔවුන්ගේ කතාව මතු කියන ඔවුන්ගේ චරිතයෙන්ම දත යුතු උපාලි මහතෙරුන් වහන්සේ ද එසේම රහත් ව විනයධාරීන් කෙරෙහි අග්‍රවූ ස්ථානාන්තර ලදින් පන්සියයක් පර්ෂද් ඇති කොට බුද්ධශාසන නමැති මහා ගෘහයෙහි ප්‍රදීපයක් සේ සසුන් බැබළවූ සේක.

I. මෙම කොටස දැක්වෙන කතා වස්තුව තුමක්ද?
II. මාර්ග ඵල අවබෝධය ලද භික්ෂූන් ගණන ලියා දක්වන්න.
III. මෙම ඡේදයේ දැක්වෙන උපමා 2 ක් උපුටා ලියන්න.
IV. ''ආකාශයෙහිනැගූ ජයකේතුවක්සේ'' කෙටි විවරණයක , යෙදෙන්න

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD.ALL RIGHTS RESERVED.

(ලකුණු 4)

(ඇ) එදවස් අභය රාජකුමාරයෝ ඒ නුවර ක්‍රීඩාවෙන් ඇවිදින්නහුය. එකල කපුටුවෝ කුමරුහු කරා රැස් ව මස් වැදැල්කෙ'යි සිසරා අතුරු නොදී තුඩු අමෝරාගෙන

කුමරුහුගේ පින් බලයෙන් කිසිවක් කොටලිය නොහි කාරැස් බඳති. එකල රාජකුමාරයෝ ''තෙල කපුටුවන් කාරැස් බඳනේ කුමන කුණුපයකට දැයි '' විචාරා ' ස්වාමීන් වළ දමාපු බාල දරු කෙනෙකුන්ටයි කී කල ''ජීවත්ද අජීවත්දැයි විචාරා, ස්වාමීනි ජීවතැයි ' කී කල ' ඔහු මෙසේ ගෙනෙව ' යි ගෙන්වා කුමරහු දක කුමරුගේ ඒ ජාතියෙහි සෝවාන් වන මහපින් බෙලෙන් හා තමන්ට ජාතවූ පුත්‍ර ස්නේහයෙන් හා ආර්ද්‍ර වූ සිත් ඇති ව එකෙණෙහි දරුපෙම් බැඳ රජගෙට ගෙන ගොස් කිරිමව්න්ට පාවා දී කුමර පෙරහරින් නොයෙක් මඟුල් කරවා වැඩූහ.

I. අභය රාජ කුමරුන් දුටු දර්ශනය කුමක්ද?
II. අනුරුද්ධ කුමාර කථාව සඳහන් ග්‍රන්ථය කුමක් ද?
III. මෙම ඡේදයේ දැක්වෙන සංකේත තුනක් ලියන්න.
IV. ස්නේහයෙන් හා ආර්ද්‍ර වූ සිත් විවරණයක යෙදෙන්න. (ලකුණු 4)

(ඈ) සරා සලෙලු දන සතොසේ
සුරා පාන කරන ලෙසේ
පුරා අවුලු නොයෙක රසේ
සරා අවන්හල් සහසේ

උදා දිනිඳු කර හරණේ
විදා අඳුරු දිසි කිරණේ
යොදා දෙපස රන් තොරණේ
සදා මෙලෙස පුර දෙරණේ

I. පළමු කාව්‍යයට අනුව හැසිරෙන්නේ කෙබඳු ජනතාවක්ද?
II. ''ආපනශාලා''සංස්කෘත වචනයෙන් භාවිතා කළ සිංහල නම කුමක්ද?
III. දෙවන කවියෙන් දැක්වෙන සරල අදහස ලියා දක්වන්න.
IV. කර හරණේ කෙටි විවරණයක් දෙන්න.

(ඊ) පහත සඳහන් උධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

I. ළඳරුව තෝ ඉතාම නුවණ නැත්තෝය.
II. පුතණුවෙනි, කුමක් කියන්දෝ ? මාගේ ඇස් දෙකක්, මාගේ හදවතත් නුඹත් මේ සතරම මට සමය.
III. ස්වාමීනි. නුඹගේ මේ ශිල්පයෙහි නිමාවක් කවර කලෙක වේද?
IV. හොඳයි මේ ගමේ වෙන කවුද ඉන්නේ මේ ළමය දෙන්ඩ
V. අවුරුදු තුනක් තාවකාලික පදනමකක් මත වැඩ කරන්න ඕන තේරුණාද?
VI. නොපමාව යනු යෙහෙකි. සමීපෙට ඔවුන්ගේ (3 × 4 = 12)

(උ) පහත දැක්වෙන කවිපෙළ රසාස්වාදයක් කරන්න.

පවුලේ බර අඩුකරන්න ගෙදරින් පිට වන්නට පෙර
මතකද අම්මේ උඹ මට ඇමතුවේ පොඩි දුවේ කියලා
ජීවිතයේ පළමුවරට තනිවුණු කල ඈත රටක
එහි මිනිසුන් හුග දෙනෙක්ම මට කිව්වේ ලිසී කියලා

අතින් හිසින් බර උසුලන් පාර දිගේ මං යනකොට
දකින කෙනෙක් මට කිව්වේ ඒ වැඩකාරියක් කියලා
පොඩි දරුවෙකු අතින් අරන් පාසැලකට මං යනකොට
එතන හිඳින අය කිව්වේ බේබිගේ ආයම්මා කියලා

කෑම බීම උයා පියා මං දර දිය අදින කලට
දකින සියලූ දෙනා කිව්වේ ගෙදර කුස්සි අම්මා කියල
ඒත් අම්මේ දවස ගෙවිල නිදි පැදුරේ ඇල වුණාම
තවමත් සිහිනෙන් උඹ මට කියන්නෙ පොඩි දුවේ කියල

2) නිර්මාණශීලීත්වය මතු කරමින් කථා ඉදිරිපත් කිරීම සද්ධර්මරත්නාවලියෙහි සුවිශේෂී ලක්ෂණයකි. නියමිත කථාවස්තු ඇසුරෙන් පැහැදිලි කරන්න.

නැතහොත්

මිනිස් සිතෙහි ස්වභාවය එක සේ සාකච්ඡාවට භාජනය වකරමින් සංකීර්ණ මනුෂ්‍ය ස්වභාවය විවරණය කිරීමට ජාතක කථාකරුවා සමත් වී ඇති අයුරු නියමිත කථා ඇසුරෙන් විමසන්න.

3) කෝට්ටේ යුගයේ රචිත ගුත්තිල කාව්‍ය තුළින් වැත්තෑවේ මාහිමි සතු කාව්‍යමය හැකියාව පෙන්නුම් කරන්නකි. නියමිත වැනුම් ඇසුරෙන් විමසන්න.

4) දුප්පත් අහිංසක අසරණ ගැමි දිවිය දුඛිත භාවය හා කුටෝපක්‍රමවලට හසුව විනාශ වී යන අයුරු බැද්දේගම නවකතාවෙන් අපූර්වලෙස ප්‍රතිනිර්මාණය වේ. විමසන්න.

5) අසූව දශකයේ කාව්‍ය නිර්මාණ වල විශේෂත්වයක් වනුයේ උචිත ශබ්දාර්ථ, ධ්වනි නිර්මාණය කරමින් වඩාත් සමකාලීන අත්දැකීම් යොදා ගනිමින් එහි සංකීර්ණභාවය සුරක්ෂිත කරමින් කාව්‍යට නැගීමයි. නූතන පද සංග්‍රහයේ නිර්මාන තුනක් ඇසුරෙන් පහදන්න.

6) පේමතෝ ජායතී සෝකෝ නාට්‍යයේ සාර්ථකත්වයට ප්‍රධාන හේතුව වන්නේ ඒ සඳහා යොදාගත් ගීතමය භාෂාවයි පහදන්න.

7) පන්ති විෂමතාව මතු කරමින්, පීඩාවට පත් පුද්ගල චරිත ස්වභාවයන් දෙස සානුකම්පිත දෘෂ්ටියක් හෙළීමට කෙටි කතාකරුවෝ සමත් වූ අයුරු නිර්මාණ තුනක් ඇසුරින් විමසන්න.

## II කොටස

### ආදර්ශ ප්‍රශ්න පත්‍රය

එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගෙන එයට හිමි අංකය වරහන තුළ ලියන්න

1. අර්ධ ස්වර ඇතුළත් වරණය වන්නේ,

i. ඍ, ඎ, ඏ, ඐ ii. අ, ඉ, උ, එ ii. ය, ර, ල, ව iv. ක, ච, ත (............)

2. ඔෂ්ඨාක්ෂර පමණක් යෙදී ඇති වරණය තෝරන්න,

i. ක, ඛ, ග, ඝ, ඞ ii. ක, ඨ, ද, ධ, න ii. ට, ඨ, ඩ, ඪ, ණ iv. ප, ඵ, බ, භ, ම (............)

3. අකාරාදි පිළිවෙළට ලියා ඇති පද පේළිය තෝරන්න.

i. පින්සරා, පින්දද, පියුම්, පිසර ii. ලක්මාල් , ලක්ප්‍රිය, ලක්ජය, ලක්සර
ii. මයුමි, මමිය, මන්දිර, මින්දද iv. විසල්, විචමල්, විසසර, වික්ශයින් (............)

4. ව්‍යාකරණාකූලව නොගැළපෙන පදයක් ද ඇතුළත් පද පේළිය තෝරන්න.

i. නටන, නැටූ, ගයන, ගැයූ ii. මෙන් , සේ , වූ , වැනි
ii. අහෝ, අනේ, මිස, පවූ iv. අඟනක, ශිෂ්‍යාවක , මිනිසුන් , දෙවියන් (............)

5. ව්‍යාකරණානුකූලව නිවැරදි නොවූ වාක්‍ය තෝරන්න.

i. පුත වීරයෙකු මෙන් දිරිය ගන්න ii. ගංගාවෝ මුහුදට ගලා බසිති
ii. නටත් අයෙක් සුරා මතින් iv. ක්‍රීඩකයින් සියල්ලෝම ඉන්දියානුවෝය (............)

6. තත්භව වචනය පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

i. හර්ෂණී, දර්ශනී, භ්‍රාන්තිය, වික්‍රම ii. සඳ, මානය, වෙහෙර, මඟ
ii. නිර්මාණි, සම්මාණි, විකැග්නි, ග්‍රාම iv. ග්‍රන්ථය, සූර්යය, වස්ත්‍ර, පාසල (............)

7. තද්ධිත වර්ගයට අදාළ නොවන තද්ධිත පදයක් ඇත්තේ,

i. නූතන අද්‍යතන පුරාතන චිත්තන ii. කැනිති. සිඟිති, බයාදු, ඇඳිරි
ii. පියාණ , මැණී, පුතණු, දෝණී iv. නෙතු, වරලස්, මුහුලස්, ධනවත් (............)

8. ක්‍රියා ප්‍රභේදයට නොගැලපෙන ක්‍රියාපදයක් සහිත වරණය වන්නේ,

i. නැසේවා, විනාශවේවා, භංගවේවා, චුතවේවාii. වැටී පැමිණ , කා, බී
ii. ගොස්, බැඳීත්, යන , මරුව iv. කපමින්, යමින් , දුවමින් , වැටෙමින් (............)

9. නිවැරදිව විරුද්ධාර්ථ ගැන් වී නැති පදයක් ඇතුළත් වන වරණය වන් 'නේ,

i. සල නිසල, උච්ච නීච, සිරිත් විරිත් ii. යන එන, නාථ අනාථ , උදක නිරුදක
ii. රස නිරස, සමඟි අසමඟි, අවුල් නිරවුල් iv. කුසල අකුසල, උස් මිටි, ඇති නැති (............)

10. සන්ධි ප්‍රභේදයට අදාළ නොවන පදයක් අන්තර්ගත පිළිතුර වන්නේ,

i. අල්ලස්, තඹපල්ලෙන් ii. කළඹ, අනුරුත් ii. දැත මැත iv. විදුරසවි , විනිසුරු (............)

දේශක - ශාස්ත්‍රපති , ආනන්ද ඩී. සිල්වා

අවසන් කොටස හෙට පත්‍රයේ

11. උපසර්ගයක් යෙදී නොමැති වරණය වන්නේ,
i ආපහාෂණ, අවලක්ෂණ, සංචාර    ii සුපිපි, දුබල, නිමල
iii පිළිතුරු, විවාද, සත්පුරුෂ    iv අපවාද, අනුශාසක සිලාචාර    (..........)

12. පහත සඳහන් වරණ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
මූර්ධජ 'ෂ' පරව 'න' යෙදේ.
ගාත්‍රාක්ෂරයකට තනිව නැගී සිටිය හැක.
රේඵය යනු සිංහලයේ 'ර්' ශබ්දය වෙනුවට යෙදෙන සංකේතයයි.
රේඵය වෙනුවට රකාරාංශය භාවිතා වේ.    (..........)

13. රකාරාංශය, ගයනුකිත්ත, රේඵය, සහිත වචන අනුපිළිවෙලින් යෙදී ඇති පේළිය . .
සම්මන්ත්‍රණය, බෞද්ධ, ඓක්‍යය
සගී, ප්‍රදානය, ඖෂධ
සංක්‍රමණ, භෞතික, චර්ම
භ්‍රාන්තිය, වර්ණ, නෞකාව    (..........)

14. මුලින් යෙදී ඇති වචනයට අර්ථයෙන් සමාන නොවන වරණය තෝරන්න.
අනංගයා-උනහ, සමර-මින්දද
දද- කුෂ්ඨය, කොඩිය-අඳුන
මට-මාතෘ, දිනිති-කිතිති
අහස-ගගන, සුරගන-තබෝ ගැබ    (..........)

15. අන්‍යාර්ථ සමාසයට අයත් නොවන වරණය වන්නේ. . . .
බුදුරජ ජින හගවා
සහසැස්, සුරරද, සුරගන
විෂ්ණු වෙණු නාරායන
කුළු, ශුක්ල, කාලවර්ණ    (..........)

16. අනුක්ත පද පේළිය තෝරන්න.
අගනක, එකෙක්, තවකෙකු
තිළියක, මිනිසුන්, දෙවියන්
සමහරකු, තවෙකෙක්, අයෙක්
ඔවුන්, ගිරවුන්, යක්කු    (..........)

17නිවැරදි කර්මකාරක වාක්‍යය වන්නේ,
මා විසින් අපි කැඳවනු ලැබිමි.
නායකයින් විසින් ළමුන් අමතනු ලැබිය.
අප විසින් මම කැඳවනු ලැබිමි.
ගුරුවරුන් විසින් නායකයෝ කැඳවනු    (..........)

18. කෘදන්ත පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
නැටිම්,ගැයීම්,බැලීම්
නටන,ගයන,වයන
කරන,හදන,බලන
සිතුළ,දුන්,අතුළ    (..........)

19. අපර ක්‍රියාව වන්නේ. . .
කා
නටමින්
දුවන්න
හඬනුවස්    (..........)

20. නිවැරදිම ප්‍රස්ථාව පිරුළ වන්නේ. . . .
ලන්දේසියා,කෝට්ටේ ගියා වගේ
කණ කැස්බෑවාගෙන් පිහාටු ඉල්ලීම
[illegible] වගේ
දෙගුල් අස්සේ කිරි අල දූම්මා වගේ    (..........)

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD.ALL RIGHTS RESERVED.

අ.පො.ස. (උ.පෙළ) 2019 - සිංහල ii(ව්‍යාකරණ)

03) දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300-350 අතර වන සේ රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.
සංචාරක කර්මාන්තය රටක සංවර්ධනයට හේතු වේ
නූතන තාක්ෂණය අබියස වැනසී යන සොබා දහම
ළමා චරිත සංවර්ධනයෙහි ලා ජන කතාවලින් සැපයෙන පිටිවහල
විද්‍යුත් අධ්‍යාපන ක්‍රමයක් මෙරටට හඳුන්වා දීමේ යෝග්‍යතාව    (ලකුණු 25)

04) පහත සඳහන් වක්‍යවල සදෙස් තැන් ඇතොත් නිදෙස් කොට ලියන්න

(අ)
සංදේශයෝ සිංහල සාහිත්‍ය නව මගකට යොමු කළේය
ඇතැම් වෛද්‍යවරු ගායකයන් වෙති
ඈ දක්ෂව රූපලාවණ්‍ය ශිල්පිනියක විය
අධ්‍යාපනය කෙතරම් වැදගත්දැයි මහාචාර්යවරු පවසනු ඇත
සභා තුමු සතුටින් විසිර ගියේය

(ආ)
පහත සඳහන් වාක්‍ය කර්මකාරකට හරවන්න
මහ ඇමති පරිගණක මධ්‍යස්ථානයට මුල් ගල තබයි.
අමාත්‍යයෝ රාජ්‍ය භාණ්ඩාගාරය හිස් කළහ
පාලකයෝ මාධ්‍යවේදීන් මර්දනය කළහ
සමහරෙක් නවකතා පොත් නොකියවූහ
නොනෙක් මල් උයනට පැමිණෙති

(ඉ)
නිවැරදි වාක්‍යක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරන්න.
(මිනිස්සු/මිනිසුන්) මග සකසද්දී අපි එතැනට ගියෙමු
උන්මත්තකයෝ (යහපත්හු/සිල්වත්හු) පෙළා දමති
(මා/මම) ඔහුගේ (ගුරුවරයෙකු/ගුරුවරියකු) වෙමි.
(ඔවුන්/ ඔවුහු) සත්‍යවාදී අය වූහ
(කිසිවෙක්/ කිසිවෙකු) සත්‍යවාදීන් නොවෙති

05. තද කළු අකුරින් ඉරිඇඳි පද කුමන ව්‍යාකරණ අංගයකට අයත් දැයි විමසන්න
**අභිනව ගිලිහෙන** බව තොම දන්නෝ
**උදුල කරවන අවිදු ගණඳුරු**
සාහිත්‍යය **රසාස්වාදයේදී විචාරකයා** මධ්‍යස්ථයකු වීමට නම් ඔහු **විදග්ධයකු** විය යුතුමය
පෙරපරවණින් නිසි **විඳිනු ගලපනු** සඳහම්
රටේ **අභිවෘද්ධිය** සඳහා මනා පෞරුෂයකින් යුත් **යෞවන** සමාජ **අත්‍යාවශ්‍ය** වේ    (ල.15)

06. පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් ගැලපෙන ප්‍රස්ථාවපිරුළ ලියන්න
අ)
තමන්ට උදව් කළ අය පසුව නොසලකා හැරීම
අනම්ට හිග කාලයට සමාජයෙන් ඈත්වීම හොඳයි
අනුන් රවටා වැඩ ගන්නට යාමෙන් තමන් රැවටීම
හැමෝම බොරු කීම
ජන්ම ගති වෙනස් කළ නොහැක
පහත් අයකු උසස් ක්‍රියාවක් නොකිරීම    (ල.03)

ආ)
පහත දී ඇති පදයට ගැලපෙන යුගල පදය තෝරන්න.
i තද ..............    ii ආන ..............    iii අරුම ..............
iv අගු ..............    v අගර ..............    vi සුද්ධ ..............

ඉ) සමානාර්ථ පද (පර්යාය පද) එක බැගින් ලියන්න
i ඊශ්වර ..............    ii පොකුණ ..........    iii අනල ..........
iv මාලව්..............    v මුහුද ..........

ඊ) පහත දී ඇති ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද ලියා දක්වන්න. (ල.3)
iඉයන්තුව ..............    iiමාගල ..............    iiiගින්නා ..............
ivරසබෝය ..............    v......    vi මුකලාන ..............    (ල.3)

උ) පහත දැක්වෙන ඉඟි වැකිවල නිවැරදි අර්ථය ලියන්න.
i අතමාරුයක්    iiඅත දිගහැර    iiiඅත්පිට    ivඅරුමෝසම්
vඅවලම්    viආරේ ගුණ    (ල.3)

දේශක - ශාස්ත්‍රපති , ආනන්ද ඩී. සිල්වා